මේ ගැන ඔබේ අදහස කුමක් ද? නියම කරන ලද සලාත් ඉටු කර; රමළාන්හි උපවාස ශීලය රැක; අනුමත දෑ අනුමත කරගෙන; තහනම් දෑ තහනම් කරගෙන;

ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. සැබැවින්ම පුද්ගලයකු අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් මෙසේ විමසීය. "මේ ගැන ඔබේ අදහස කුමක් ද? නියම කරන ලද
සලාත් ඉටු කර; රමළාන්හි උපවාස ශීලය රැක; අනුමත දෑ අනුමත කරගෙන; තහනම් දෑ තහනම් කරගෙන; පසුව ඒවාට අමතරව වෙනත් කිසිවක් මා විසින් සිදු නොකළේ නම්, මම ස්වර්ගයට පිවිසෙන්නේ ද? එතුමාණෝ: "එසේය" යැයි පිළිතුරු දුන්හ. එවිට ඔහු: "අල්ලාහ් මත
දිවුරා ප්රකාශ කරමි. ඒවාට වඩා කිසිවක් මම අමතරව සිදු නොකරමි" යැයි පැවසීය.
[صحيح] [رواه مسلم]

කවරෙකු අතිරේක සලාත් ඉටු නොකර, නියම කරන ලද පස්වාර සලාත් පමණක් ඉටු කළේ ද, අමතර උපවාසයේ නිරත නොවී රමළාන් උපවාස ශීලය පමණක් රැක්කේ ද, අනුමත දෑ අනුමත යැයි විශ්වාස කොට එය ඉටු කළේ ද, තහනම් දෑ තහනම් බව විශ්වාස කොට ඉන් වැළකී සිටියේ ද සැබැවින්ම ඔහු ස්වර්ගයට පිවිසෙන බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙහි පැහැදිලි කර සිටියි.

https://sunnah.global/hadeeth/si/show/65003